I - 108

# ථෙරවාද සම්ප්‍රදාය: නවීකරණ හා සංස්කරණ
# (නුවර යුගයේ සිට වර්තමානය දක්වා)

පූජ්‍ය හාරිස්පත්තුවේ අරියවංශාලංකාර හිමි
ලියාපදිංචි අංකය: 2007-PhD-2065

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ දර්ශන විශාරද උපාධි පාඨමාලාවේ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධය.

2012

# සංක්ෂේපය

මහනුවර යුගයේ සිට වර්තමානය දක්වා ථෙරවාද සම්ප්‍රදාය තුළ ඇති වූ විවිධ ප්‍රවණතාවන් අධ්‍යයනය කිරීමත් ඒ තුළින් එම සම්ප්‍රදායයේ ඉදිරි ගමනට ආදර්ශයක් සැපයීමත් මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය විය.

මහනුවර යුගයේ සිට වර්තමානය දක්වා කාලපරාසය ගණනය කළ හැක්කේ පළමුවැනි විමලධර්මසූරිය රජුගේ පාලන කාලයේ සිටය. එනම් වර්ෂ 1592 වර්ෂයේ සිටය. ඒ අනුව ගතවූ වසර හාරසියයක කාල අන්තරයක් තුළ එදා මෙදාතුර ශ්‍රී ලාංකීය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායයේ සිදුවූ සංස්කරණ හා නවීකරණ ප්‍රමාණය අතිවිශාලය. ථෙරවාද බෞද්ධ සම්ප්‍රදායයේ ආරම්භයේ සිට සලකන විට එහි ඇතිවූ සංස්කරණ හා නවීකරණ අතරින් වැඩිම ප්‍රතිශතයක් අයත් වන්නේද මෙම ගතවූ වසර 400 තුළ වීම විශේෂත්වයකි. එසේ සිදුවූ සංස්කරණ මෙන්ම නවීකරණයන් ථෙරවාද සම්ප්‍රදායයේ පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කරන ඒවා බව කිවහැකිය. ඒවා මෙසේය.

1. භික්ෂු ජීවන රටාව
2. භික්ෂු ආකල්ප
3. ආරාමික පරිසරය
4. සාංඝික දේපොල
5. ගිහි ජන ආකල්ප
6. රාජ්‍ය තන්ත්‍රය
7. බෞද්ධ සාහිත්‍යය
8. බෞද්ධ කලාශිල්ප
9. සමයාන්තර සංකල්ප හා ක්‍රියකාරකම්
10. බෞද්ධ අධ්‍යාපනය

ඉහත දැක්වූ අංශවල සිදුවූ සංස්කරණ හා නවීකරණ සියල්ල නියෝජනය කරන ඓතිහාසික සංසිද්ධි දාමයක් ලෙස ගොණු කොට පහත සඳහන් ආකාරයේ සිද්ධි ලේඛනයක්

සකස්කොට දැක්විය හැක. මේ සියළු සංස්කරණයන් හා නවීකරණ නැතහොත් නව ප්‍රවේශ සියල්ල ශ්‍රී ලාංකීය ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය සම්බන්ධයෙන් ඍජුව මෙන්ම වක්‍රව ද ප්‍රබල බලපෑම් ඇතිකරවූ ඒවා බව සැලකිය යුතුය. ඒ මෙසේය

1. හින්දු හා ක්‍රිස්තියානි ආගමික බලපෑම නිසා සහ මුහුදුබඩ පෙදෙස් අනාරක්ෂිත වීම නිසා උඩරට රාජධානි වෙනස් වීම.
2. දෙවනගල තෙරුන්නාන්සේගේ මූලිකත්වයෙන් පළමුවන විමලධර්මසූරිය රජු ශිවබලය යටපත් කිරීම.
3. සෙනරත් (සේනාරත්න) රජුගේ කාලයේදී (1604-1635) පෘතුගීසීන් උඩරට ආක්‍රමණය කිරීම.
4. පළමු විමලධර්මසූරිය රජුගේ පාලන කාලයේදී ධර්මකීර්ති නම් භික්ෂුවකගේ මූලිකත්වයෙන් ලාංකීය භික්ෂූන් 350 නමක් උපසපන් කරවීම.
5. යළිත් වරක් රක්ඛංග දේශයෙන් භික්ෂූන් ගෙන්වාගෙන ගැටඹේතොටේදී උපසම්පදාවක් කරවීම.
6. සෙනරත් (1604-1635) හා II වන රාජසිංහ (1635-1687) යන දෙරජුන්ගේ වසර 83ක කාලය තුළ ලාංකික භික්ෂු උපසම්පදාව සිදු නොකිරීම.
7. II වන විමලධර්මසූරිය රජුගේ කාලය වනවිට (1687-1707) ලංකාවේ එකද උපසම්පන්න භික්ෂුවක් හෝ සොයාගත නොහැකි වීම.
8. පෘතුගීසීන් විසින් තනතුරු, රැකීරක්ෂා හා දඬුවම් දීම් මගින් බෞද්ධයන් රෝමානුකතෝලික ආගමට හැරවීම.
9. ලන්දේසීන් විසින් බෞද්ධයන් රෙපරමාදු ක්‍රිස්තියානියට බලහත්කාරයෙන් හැරවීම.
10. ගණින්නාන්සේලා යනුවෙන් ව්‍යවහාරවූ සාමණේර පිරිසක් විසින් ලංකා භික්ෂු ශාසනය පවත්වාගෙනයාම.

11. 1753 දී මහනුවර පෝයමළු විහාරයේදී ශ්‍යාම වංශික උපාලි තෙරුන්ගේ මූලිකත්වයෙන් ලක්දිව යළිත් උපසම්පදාව ස්ථාපනය කිරීම. ශාසනික පැවිද්ද සඳහා කුලක්‍රමය සාධකයක් කරගැනීම.

12. 1815දී ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් බ්‍රිතාන්‍ය පාලනයට නතු වීම.

13. උඩරට ගිවිසුමේ 5වන වගන්තියෙන් බුද්ධාගමට රාජ්‍ය අනුග්‍රහ ලැබෙන බව ලිඛිතව පෙන්වාදීම.

14. දළදාවහන්සේගේ භාරකාරත්වය, ආරක්‍ෂාව තර්ජනයට ලක්වීම.

15. 1834 උඩුවේ තෙරුන් ද 1843දී චන්ද්‍රජෝති නම් තෙරුන් ද 1848දී කුඩාපොල තෙරුන්ද රට, ජාතිය, ආගම ඉංග්‍රීසීන්ගෙන් මුදාගැනීමට සටන් සඳහා පෙරමුණ ගැනීම.

16. 1803දී වැලිතර අඹගහපිටියේ ඤාණවිමලතිස්ස හිමි විසින් අමරපුර නමින් නිකායයක් පිහිටුවීම.

17. 1848 සිට භික්‍ෂූන්ගේ පදවි හා තනතුරු පිරිනැමීමේ රජයේ වගකීමෙන් ඉංග්‍රීසි පාලකයන් ඉවත්වීම.

18. 1864දී අඹගහවත්තේ ඉන්දාසභවර ඤාණසාමි නමින් ප්‍රකට තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් රාමඤ්ඤ නිකාය ඇරඹීම.

19. 1867දී පැල්මඩුල්ලේ ධර්මශාලාවේදී ත්‍රිපිටක ශුද්ධියක් පිළිබඳ ධර්ම සාකච්ඡාවක් සිදුකිරීම.

20. 1880 ඕල්කොට් තුමා මෙරටට පැමිණීම හා බෞද්ධ අධ්‍යාපන ආයතන බිහිකිරීම.

21. 1883 මාලිගාකන්දේ පිරිවෙනේදී බෞද්ධාරක්‍ෂක සභාව පිහිටුවීම.

22. ඕල්කොට් තුමා එංගලන්තයට ගොස් කරුණු දන්වා වෙසක් පොහෝදිනය නිවාඩුදිනයක් ලෙස ප්‍රකාශ කිරීම.

23. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම හා මහාබෝධි සංගමය ආරම්භ කිරීම.

24. කොළඹ තරුණ බෞද්ධ සංගමය ඇරඹීම හා ඉරුදින දහම්පාසල් බිහිවීම (1885-1890 අතර).

25. 1873 විද්‍යෝදය පිරිවෙනත්, 1875 විද්‍යාලංකාර පිරිවෙනත් ඇරඹීම.

26. එම ආයතන දෙකට සමගාමී උප පිරිවෙන් ආයතන රටපුරා ඇරඹීම.

27. 1865දී බද්දේගම වාදයත්, 1866දී උදන්විට වාදයත්, 1871දී ගම්පොළ වාදයත්, 1873දී පානදුරාවාදයත්, 1899දී ඌරුගොඩවත්ත වාදයත් යන සමයාන්තර වාද සිදුවීම .

28. 1935දී රුවන්වැලි චෛත්‍යයේ දේවතා කොටුවේ ධාතු නිධානය සහ 1940 එම චෛත්‍යයේ කොත නිරාවරණය කිරීම.

29. 1936දී චීන ත්‍රිපිටකය ලක්දිවට ගෙන ඒම.

30. 1938 ගාල්ල නගර සභාවත්, 1939 කොළඹ නගරසභාවත් වෙසක් පෝදින මස්කඩ විවෘතව තැබීම තහනම් කිරීම.

31. සියම් මහා නිකාය, අස්ගිරි, මල්වතු යනුවෙන් පාර්ශව දෙකකට බෙදීයාම.

32. 1939දී සියම් මහා නිකායයෙන් ඌව ශ්‍යාමවංශික නමින් අනුනිකායයක් බෙදීයාම.

33. දශක හතරක් පමණ කාලයක් තුළ කෝට්ටේ, කල්‍යාණි, රෝහණ ආදී වශයෙන් සියම් මහා නිකාය බෙදී යාම.

34. ඒ හා සමාන ලෙසින්ම අමරපුර නිකාය අවස්ථා ගණනකදීම අනුනිකාය විසිගණනකට බෙදීයාම.

35. 1940දී සර්වඥධාතු ශ්‍රී ලංකාවට වැඩම කරවීම.

36. 1952දී පොහොයදිනයන් නිවාඩුදින ලෙස ප්‍රකාශයට පත් කිරීම.

37. 1953 සිට ගුවන් විදුලියෙන් මෛත්‍රීචින්තා, ධර්ම දේශනා, පිරිත්, ධර්ම සාකච්ඡා, බෞද්ධ උත්සව අවස්ථා යන බෞද්ධ ආගමික වැඩසටහන් ප්‍රචාරය කිරීම.

38. 1952දී හඳුන්වාදුන් සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පඤ්චමහා බලවේග සංකල්පය නිසා භික්ෂූන්ගේ දේශපාලනික ක්‍රියාකාරකම් සක්‍රිය වීම.

39. 1954දී බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාව නමින් කාරක සභාවක් පත්කිරීම.

40. 1954දී බුද්ධජයන්ති උළෙල කොළඹදී නිල වශයෙන් ඇරඹීම.

41. 1954දී බුරුමයේ ෂට්ඨ සංගායනාව පැවැත්වීම හා ඊට සහභාගි වීම පිණිස ලාංකික භික්ෂු පිරිසක් එහි වැඩමකිරීම.

42. 1954දී සියළු නිකායවල භික්ෂූන් එක්කොට "ශ්‍රී ලංකා මහා සංඝ සභාව"ත් දේශපාලන අරමුණු සඳහා "සමස්ත ලංකා භික්ෂු සම්මේලනය"ත් පසුව එම සංවිධාන ඒකාබද්ධකර 1956දී "එක්සත් භික්ෂු පෙරමුණ"ත් පිහිටුවීම.

43. ශ්‍රී ලාංකික ථෙරවාදී භික්ෂූන්ගේ පක්ෂ දේශපාලනය ප්‍රබල වීම නිසා හැටේ දශකයේ විශේෂයෙන් 1971 හා 1989 දී රජය පෙරළීමේ අභ්‍යන්තර අරගල වලදීත් තරුණ භික්ෂූන් අතිවිශාල සංඛ්‍යාවක් ඝාතනයට ලක්වීම.

44. 1972 ජනරජ ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට හිමිකර දුන් ප්‍රමුඛස්ථානය 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද තවදුරටත් තහවුරු කිරීම.

45. 1994න් පසු භික්ෂූන් පාර්ලිමේන්තු මැතිවරණ සඳහා ඉදිරිපත් වීම හා 2002 සිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස ක්‍රියාකිරීම.

46. අනුරාධපුරයේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය ඇරඹීම.

47. විද්‍යෝදය, විද්‍යාලංකාර, බලගල්ල සරස්වතී, පානදුර සද්ධර්මාකර යන පිරිවෙන් ආයතනවල බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ ශාඛා ඇරඹීම.

48. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය නමින් ව්‍යවස්ථාපනය කිරීම.

49. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල ශාඛා ඒකාබද්ධව තනි ආයතනයක් බවට පත්කිරීම.

50. කාලයක් මුළුල්ලේ විටින් විට සුදුසිවුරු නිකාය, අවබෝධ නිකාය, විනයවර්ධන, මෛත්‍රී බුද්ධ ශාසනය ආදී ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය හැරවුම් ලක්ෂයන්ට ගැනීමේ අවශ්‍යතා සහිත සංවිධාන බිහිවීම.

51. පාලි පොත් සමාගම (Pali Text Society) හෙවත් PTS ආයතනය ලන්ඩන් නගරයේ ඇරඹීම. (මෙය ඉහත අනුපිළිවෙලට අනුකූල නොවන අතර මීට බොහෝ කලකට පෙර ආරම්භ කරන ලද්දකි.)

52. 1988 රන්ගිරි දඹුලු විහාරයේදී චීන භික්ෂුණීන්ගේ දායකත්වයෙන් ශ්‍රී ලාංකීය භික්ෂුණී ශාසනයේ උපසම්පදාව ඇරඹීම. (2012 වනවිට එම වැඩපිළිවෙල නිසා ශ්‍රී ලාංකික භික්ෂුණීන් දෙදහසකට වැඩි පිරිසක් උපසම්පදාව ලබා ඇත) .

53. ප්‍රාචීන භාෂෝපකාර සමාගම බිහිවීම.

54. බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නමින් පාලි ත්‍රිපිටකය සිංහල අර්ථයද සහිතව මුද්‍රණය කිරීම.

55. මහායාන සම්ප්‍රදායයට අයත් ජපාන භික්ෂු නිකායයක් ලක්දිව ව්‍යාප්තවීමට යාමේදී එයට මෙරට භික්ෂූන් රාජ්‍ය බලය ද ලබාගනිමින් එරෙහිවී එය මැඩපැවැත්වීම.

56. ලංකාවේ අග්‍රාමාත්‍යවරයකුගේ ඝාතනයට බෞද්ධ භික්ෂුවක් සම්බන්ධ වීම.

ඉහත සඳහන් අංශවල අදාළ කාලපරාසය තුළ සිදු වූ සංස්කරණ හා නවීකරණ පැහැදිලි කිරීමට පෙරාතුව බුදුසමයේ මූලික ඉගැන්වීම් අනුසාරයෙන් එහි ස්වරූපය, අරමුණු හා පරමාර්ථය පැහැදිලි කිරීම අවශ්‍යය. පළමු පරිච්ඡේදය ඒ සඳහා වෙන් වී ඇත. අනතුරුව දෙවන පරිච්ඡේදයෙන් ථෙරවාද සම්ප්‍රදායයේ ආරම්භය හා විකාශය විග්‍රහ වේ. පර්යේෂණයේ මූලික අරමුණ වූ ථෙරවාද සම්ප්‍රදායයේ සංස්කරණ හා නවීකරණ පැහැදිලි කිරීම පැරණි යුගය හා නූතන යුගය යනුවෙන් කොටස් දෙකකට බෙදා පරිච්ඡේද දෙකක් යටතේ සිදුකොට ඇත.

සයවැනි පරිච්ඡේදයේ දී 4, 5 පරිච්ඡේදවල සාකච්ඡා වූ කරුණු පිළිබඳ විචාරාත්මක සමාලෝචනයක් ඉදිරිපත් වී ඇත. මෙහි දී මූලික බුදුසමයේ ඉගැන්වීම්වලට අනුකූලව සිදු වී ඇති වෙනස්කම් හා ඒවා ඉක්මවා ගොස් සිදු වී ඇති වෙනස්කම් මොනවාදැයි පෙන්වා දී ඇත. ඒ අනුව ථෙරවාද සම්ප්‍රදාය පිළිබඳ ඉදිරි සංස්කරණවල දී මෙම තොරතුරු පදනම් කොට ගෙන වඩාත් සාර්ථක හා විශ්වසනීය ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකිය. මෙම පර්යේෂණයෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට සිදුවන ප්‍රදානය ද මෙය වනු ඇත. වර්තමානයේ බොහෝවිට අත්තනෝමතිකව සිදුකරනු ලබන ශාසනික වෙනස්කම් පොදු සම්මතයකට පත් නොවේ. ඊට හේතුව සම්ප්‍රදායයේ ඉතිහාසය හා මූලධර්ම හොඳින් හදාරා ඊට අනුකූලව එම වෙනස්කම් සිදු නොකිරීමයි. මෙම පර්යේෂණයෙන් ථෙරවාද සම්ප්‍රදායයේ අනාගත ක්‍රියාමාර්ග නිශ්චය කිරීම සඳහා මනා ආලෝකයක් ලැබේ යැයි විශ්වාස කරමු.